**ශ්‍රී ලංකා මහ බැංකුව - 2018**
**--------------------------------**

**1.1 මතය**
**-----------**

2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශන සටහන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් සාරාංශයකින් සමන්විත ශ්‍රී ලංකා මහ බැංකුවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තියේ සහ මුදල් නීති පනතේ 42(2) වගන්තියේ (422 අධිකාරිය) ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සිදු කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැළී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ සියලු ප්‍රමාණාත්මක කරුණුවලින් සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRSs) අනුකූලව සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**
**-----------------------**

මා විසින් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISAs) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කරනු ලැබේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මුදල් මණ්ඩලයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**-----------------------------------------------------------------------------------**

මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම මුදල් මණ්ඩලයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්මෙන් යුතුව පවත්වා ගැනීම සඳහා අඛණ්ඩ පැවැත්මට අදාළවන කරුණු අදාළ වන පරිදි හෙළිදරව් කිරීම සහ ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම පදනම යොදාගනිමින් පවත්වා ගැනීම සඳහා බැංකුවේ හැකියාව ඇගයීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය වගකිව යුතු වේ.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම, පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, බැංකුව විසින් බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන බවට සාධාරණ තහවුරුවක් ලබාගැනීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාවක් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ තහවුරුවක් යන්න, ඉහල මට්ටමේ, තහවුරුවක් වන නමුත් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISAs) අනුකූලව විගණනයන් ක්‍රියාත්මක කිරීමේදී සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගැනීම සඳහා තහවුරුවක් නොවේ. සාවද්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් පැන නැගිය හැකි අතර එය තනිකර හෝ සමස්තයක් ලෙස ගත්කල ප්‍රමාණාත්මක ලෙස සැලකේ නම්, භාවිතා කරන්නන්ට මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්ව ආර්ථික තීරණ ගැනීම සඳහා බලපෑනු ලබන බවට සාධාරණව අපේක්ෂා කළ හැකිය.

ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනයේ කොටසක් ලෙස සමස්ත විගණනය තුළ මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබාවය පවත්වා ගෙන යන ලදී. එසේම මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන පරිපාටි සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ප්‍රමාණාත්මක සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම, වංචාවල ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් සොයා නොගැනීම වැරදි හෙළිදරව් නොකිරීමට වඩා වැඩි අවදානමකට හේතු වන අතර දුස්සන්ධානය, කූට රචනය, අභිප්‍රායික අත්හැරීම්, වරදවා දැක්වීම් හෝ අභ්‍යන්තර පාලනය අක්‍රීය කරන වංචා, මෙයට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විගණනයට අදාළවන අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකෙරේ.
- මුදල් මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- අඛණ්ඩ පැවැත්ම පදනම් කරගත් ගිණුම්කරණය පිළිබඳ මුදල් මණ්ඩලයේ යොදාගැනීම පිළිබඳ අදාළත්වය නිගමනය කිරීම සහ ලබාගත් විගණන සාක්ෂි පදනම් කරගෙන, අඛණ්ඩ පැවැත්මක් සහිතව පවත්වා ගෙන යාමට බැංකුවේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයකට හේතුවන සිද්ධිවලට හෝ කරුණුවලට අදාළවන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේද යන්න නිගමනය කිරීම. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවට මා විසින් නිගමනය කෙරේ නම් හෝ මාගේ මතය විකරණය කිරීම සඳහා එම හෙළිදරව් කිරීම් ප්‍රමාණාත්මක නොවේ නම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ හෙළිදරව් කිරීම් පිළිබඳ මාගේ විගණන වාර්තාවට අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මාගේ නිගමනයන්ට පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධි හෝ තත්වයන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම නතර කිරීමට හේතු විය හැක.
- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය හා අන්තර්ගතය ඇගයීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම ඉටු කරගැනීමට පාදක වූ ගනුදෙනු හා සිද්ධි මූල්‍ය ප්‍රකාශනවලින් නියෝජනය වේද යන්න ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව බැංකුව කටයුතු කර ඇති බව;

- බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව, සමාලෝචිත වර්ෂයේ බැංකුවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. බිලියන 137.9 ක ශුද්ධ ලාභය වූ අතර පසුගිය වර්ෂයේ ශුද්ධ ලාභය රු. බිලියන 48.4 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. බිලියන 89.5 ක වර්ධනයක් පිළිබිඹු විය. විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය රු. බිලියන 150.6 කින් වර්ධනය වීම මෙම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ බැංකුවේ ප්‍රධාන ආදායම් විෂයයන් සහ ප්‍රධාන වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර පහත පරිදි දක්වා ඇත.

| | 2018 | 2017 | විචලනය {හිතකර/(අහිතකර)} | |
|---|---|---|---|---|
| | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | ප්‍රතිශත |
| **විදේශ විනිමය මූල්‍ය වත්කම්වලින් ලද ආදායම** | **3.2** | **49.7** | **(46.5)** | **(93.6)** |
| පොලී ආදායම | 25.5 | 22.9 | 2.6 | 11.4 |
| උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණන ලාභය / (අලාභය) | (18.2) | 24.0 | (42.2) | (175.8) |
| උපලබ්ධි මිල වෙනස්වීම් වලින් වූ ලාභය /(අලාභය) | (4.1) | 2.8 | (6.9) | (246.4) |
| **විදේශ විනිමය මූල්‍ය වගකීම් මත වියදම්** | **5.4** | **3.0** | **(2.4)** | **(80.0)** |
| පොලී වියදම් | 5.4 | 3.0 | (2.4) | (80.0) |
| අපේක්ෂිත ණය අලාභ | .02 | - | - | - |
| **ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය / (අලාභය)** | **146.8** | **(3.8)** | **150.6** | **3,963.2** |
| **දේශීය විනිමය වත්කම්වලින් ලද සමස්ථ ශුද්ධ ආදායම / (වියදම)** | **6.2** | **16.1** | **(9.9)** | **(61.5)** |
| **වෙනත් ආදායම්** | **1.7** | **1.6** | **0.1** | **6.2** |
| **මෙහෙයුම් වියදම්** | **13.5** | **10.4** | **(3.1)** | **(29.8)** |

| | | | | |
|---|---|---|---|---|
| බදු | **1.1** | **1.8** | **0.7** | **38.9** |
| **වර්ෂයේ ශුද්ධ ලාභය / (අලාභය )** | **137.9** | **48.4** | **89.5** | **184.9** |

(අ) මුදල් නීති පනතේ 41 වන වගන්තියට අනුව, බැංකුවේ වාර්ෂික ලාභ හා අලාභ ගණනය කිරීමේදී විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභ හෝ අලාභ ඇතුළත් නොකරනු ලබයි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා වූ අලාභය රු. බිලියන 8.9 ක් ක් වූ අතර (ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභ රු. බිලියන 146.8 ක් හැර) පසුගිය වර්ෂයේ ලාභය රු. බිලියන 52.2 ක් වූයෙන් (ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන අලාභය රු. බිලියන 3.8 ක් හැර) ලාභයේ සියයට 117 ක පිරිහීමක් පිළිබිඹු විය. විදේශ විනිමය මූල්‍ය වත්කම් වලින් ලද ආදායම රු. බිලියන 46.5 කින් අඩුවීම සහ දේශීය විනිමය මූල්‍ය වත්කම් වලින් ලද ශුද්ධ ආදායම බිලියන 9.9 කින් අඩුවීම මෙම ලාභයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) මුදල් නීති පනතේ 38 සහ 41 වැනි වගන්ති හා බැංකුවේ ලාභ බෙදා හැරීමේ ප්‍රතිපත්තියට අනුව තීරණය කරන ලද බෙදා හැරිය හැකි ලාභයක්, සමාලෝචිත වර්ෂය සඳහා නොතිබුණි. ඒ අනුව ඒකාබද්ධ අරමුදලට කිසිදු මුදලක් බෙදා හැරීමට නොහැකි වී තිබුණි. කෙසේ වෙතත්, පෙර වර්ෂයේදී බෙදා හැරිය හැකි ලාභය වූ රු. බිලියන 27.4 න් ඒකාබද්ධ අරමුදලට රු. බිලියන 15 ක් බෙදා හැර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා උපලබ්ධි මිල වෙනස්වීම් වලින් වූ අලාභය රු.බිලියන 4.1 විය. එය තුළ ප්‍රධාන වශයෙන්, ඇමෙරිකානු ඩොලර් මිලියන 122.41 ක් වටිනා රන් (Paper Gold) ට්‍රොයි අවුන්ස් 77,070 ක් 2018 මාර්තු 22 දින සිට 2018 අප්‍රේල් 04 දින දක්වා කාලය තුළදී අලෙවි කිරීමෙන් වූ රු. බිලියන 2.99 ක (ඇමෙරිකානු ඩොලර් මිලියන 19.17) අලාභය ඇතුළත් විය. විදේශ විනිමය සහ රන් ගනුදෙනුවලදී මීට පෙර පැවති මාසයක් සඳහා වන උපරිම ගනුදෙනු අලාභ සීමාව (Maximum dealing room loss limit) ඇමෙරිකානු ඩොලර් 150,000 ක් විය. ඉහත රන් අලෙවි කිරීම සඳහා උපරිම අලාභ සීමාව ඇමෙරිකානු ඩොලර් මිලියන 22 ක් දක්වා 2018 මාර්තු 20 වැනි දින මුදල් මණ්ඩලය විසින් වැඩි කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය
-------------------------------

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-----------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ. | **මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ වැඩ සටහන** ආර්ථිකයේ වැඩෙන ඉල්ලුමට සරිලන පරිදි අභ්‍යන්තර හා බාහිර කම්පනයන් සඳහා ඔරොත්තු දීමේ හැකියාව වැඩි කරන ශක්තිමත් බැංකු / බැංකු නොවන මූල්‍ය ආයතන අංශයක් සංවර්ධනය කිරීමේ අරමුණින් 2014 ජනවාරි 17 වන දින මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම සඳහා බැංකුව විසින් ප්‍රධාන සැලැස්ම එළිදැක්විණි. ඒ අනුව, 2018 මාර්තු 31 වැන දිනට රු. මිලියන 74 ක් වැය කරමින් බැංකු, මුදල් සමාගම් හා කල්බදු සමාගම් ඇතුළු ආයතන 19 ක් සමහ වූ ඒකාබද්ධ කිරීමේ සැලසුම් සම්පූර්ණකර තිබුණි. කෙසේ | මූල්‍ය ආයතන 19 ක් සම්බන්ධ ඒකාබද්ධ කිරීමේ ගනුදෙනු 9 ක් සම්පූර්ණ කරන ලදී. 2014 වර්ෂයේ දී පූර්ණ හෝ අර්ධ වශයෙන් අත්පත් කර ගැනීමෙන් ආරම්භ කරන ලද මූල්‍ය ආයතන 14 ක් සම්බන්ධ ගනුදෙනු 7 ක්, රජයේ ප්‍රතිපත්ති වෙනස් වීම හේතුකොට ගෙන සම්පූර්ණ කළ නොතිබුණි. මූල්‍ය සමාගම් අතර ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය | සම්පූර්ණ කර නොමැති ඒකාබද්ධ කිරීමේ සැලසුම්, සම්පූර්ණ කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග ගැනීම. |

| | | | |
|---|---|---|---|
| | වෙතත්, 2019 මාර්තු මාසය අවසන් වන විටත් ආයතන 14 ක් සමඟ වූ ඒකාබද්ධ කිරීමේ සැලසුම් සම්පූර්ණ කර නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් රු. මිලියන 53 ක මුදලක් බැංකුව විසින් වැය කර තිබුණි. ඉහත වියදම් වලට අමතරව, ඉහත ඒකාබද්ධ කිරීමේ සැලසුම්වල ඇතුළත් නොවූ ආයතන 20 ක් සම්බන්ධව තොරතුරු ලියවිල්ල, නිසි විශ්ලේෂණ හා තක්සේරු වාර්තා පිළියෙල කිරීම සහ අනෙකුත් කාරණා සඳහා බැංකුව විසින් රු. මිලියන 59 ක් වැය කර තිබුණි. | කිරීමේ අරමුණින් බැංකුව විසින් මූලික ප්‍රාග්ධනය සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය යන නියමයන් මත දැඩි ප්‍රාග්ධන අවශ්‍යතා හඳුන්වා දී ඇත. | |
| ආ. | **මුදල් සමාගම් නියාමනය සහ අධීක්ෂණය**<br>බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතට අනුව මුදල් සමාගම් නියාමනය සහ අධීක්ෂණය සිදු කරනු ලබයි. මුදල් ව්‍යාපාර පනතේ වගන්ති අංක 12 (1) ප්‍රකාරව, මුදල් සමාගම්වල ව්‍යාපාර සහ ආයතනික කටයුතුවල යම් අංගයක් පවත්වාගෙන යාම සඳහා මුදල් මණ්ඩලය විසින් මුදල් සමාගම්වලට විධානයන් දෙනු ලැබිය හැකිය. කෙසේවෙතත්, මුදල් ව්‍යාපාර පනතේ වගන්ති අංක 12 (1) යටතේ දක්වා ඇති කාරණා 8 ක් සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි විධානයන් 2019 මාර්තු අවසාන වනවිටත් නිකුත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.<br><br>මුදල් සමාගම් නියාමනය සහ අධීක්ෂණය සඳහා ඉහත කරුණු පිළිබඳ විධානයන් විශේෂයෙන්, ඒම සමාගම් විසින් ප්‍රදානය කරනු ලබන ණය, ණය පහසුකම් හෝ වෙනත් වර්ගයකට අයත් මූල්‍ය පහසුකම් මත අයකරනු ලැබිය හැකි උපරිම පොළී අනුපාතයන් සඳහා වන විධානයන්, ඒම සමාගම්වල අධ්‍යක්ෂවරුන්ට හෝ සේවකයින්ට කරනු ලබන ගෙවීම් පිළිබඳ විධානයන් සහ පුද්ගලයින් විසින් මුදල් සමාගමක කොටස් ප්‍රාග්ධනයෙන් දැරිය හැකි උපරිම අනුපාතය පිළිබඳ විධානයන් වැදගත් වන බවට තවදුරටත් නිරීක්ෂණය විය. | මූල්‍ය ව්‍යාපාර පනතේ 12 (1) වගන්තිය යටතේ විධානයන් නිකුත් කිරීමට බලතල පැවරී තිබුණද, සමාගම්වල ව්‍යාපාර මෙහෙයුම් සම්බන්ධයෙන් විධානයන් අවශ්‍ය විටදී නිකුත් කරනු ලැබේ.<br>කෙසේ වෙතත්, ව්‍යවස්ථාපිත පරීක්ෂණ / ස්ථානයෙන් බැහැර පරීක්ෂණ සිදු කරන විටදී, සමාගම් නිසි අවදානම් කළමනාකරණ පරිචයන් අනුගමනය නොකරන බවත්, නිසි ව්‍යාපාර හැසිරීම් නොමැති බවත් බැංකුව නිරීක්ෂණය කරන්නේ නම්, එක් එක් සිද්ධියේ සොයාගැනීම් මත පදනම්ව නිශ්චිත සමාගමකට අදාළ වන පරිදි විධානයන් නිකුත් කරනු ලැබේ. | මුදල් සමාගම් නියාමනය සහ අධීක්ෂණය සඳහා වැදගත් වන විධානයන් නිකුත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |
| ඇ.<br>i. | **ලීසිං සමාගම් නියාමනය හා අධීක්ෂණය**<br>ලීසිං ආයතන 2000 අංක 56 දරණ මූල්‍ය කල්බදු පනත යටතේ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නියාමනය හා අධීක්ෂණය කරනු ලැබේ. මූල්‍ය කල්බදු පනතේ 34 වන වගන්තියට අනුව, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට ලියාපදිංචි ආයතනවල ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීම සඳහා කාර්යක්ෂම ප්‍රමිතීන් පවත්වා ගෙන යාම සහතික කිරීම සඳහා අවශ්‍ය යැයි ඔහු සලකනු ලබන | මූල්‍ය කල්බදු පනතේ 34 වන වගන්තිය යටතේ විධානයන් නිකුත් කිරීමට බලතල පැවරී තිබුණද, සමාගම්වල ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් විධානයන් අවශ්‍ය විටදී නිකුත් කරනු ලැබේ.<br>කෙසේ වෙතත්, ව්‍යවස්ථාපිත පරීක්ෂණ / ස්ථානයෙන් බැහැර පරීක්ෂණ සිදු කරන විටදී, | කල්බදු සමාගම් නියාමනය හා අධීක්ෂණය සඳහා වැදගත් වන විධානයන් නිකුත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |

| | | | |
|---|---|---|---|
| | කිසියම් පොදු විධානයන් නිකුත් කිරීමට බලය ඇත. කෙසේ වෙතත්, මූල්‍ය කල්බදු පනතේ 34 වන වගන්තියේ සඳහන් කාරණා 4 ක් සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි විධානයන් නිකුත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.<br><br>ලීසිං සමාගම් නියාමනය කිරීම සඳහා ඉහත සඳහන් කරුණු පිළිබඳ විධානයන් විශේෂයෙන් ලියාපදිංචි ආයතන විසින් අය කළ යුතු උපරිම ගෙවීම් අනුපාතයන් පිළිබඳ විධානයන් වැදගත් බව තවදුරටත් නිරීක්ෂණය විය. | සමාගම් නිසි අවදානම් කළමනාකරණ පරිචයන් අනුගමනය නොකරන බවත් නිසි ව්‍යාපාර හැසිරීම් නොමැති බවත්, බැංකුව නිරීක්ෂණය කරන්නේ නම්, එක් එක් සිද්ධියේ සොයාගැනීම් මත පදනම්ව නිශ්චිත සමාගමකට අදාළ වන පරිදි විධානයන් නිකුත් කරනු ලැබේ. | |
| ii. | 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනතට අනුව, බදු දීමනාකරුගේ, බදු ගැණුම්කරුගේ සහ සැපයුම්කරුගේ කාර්යභාරය වගන්ති අංක 11 සිට 31 දක්වා විස්තර කර ඇත. වගන්ති අංක 11 අනුව, මූල්‍ය කල්බදු යටතේ බදු ගැණුම්කරුට ලබා දී ඇති උපකරණවල නිරවුල් හා සාමකාමී සන්තකය බදු ගැණුම්කරුට ඇති එකම අයිතිය වේ. වගන්ති අංක 15 අනුව, මූල්‍ය කල්බදු කාල සීමාව ඉකුත්වීමෙන් පසු, බදු ගැණුම්කරු විසින් බදු දීමනාකරු වෙත උපකරණය ආපසු භාරදීම, සාධාරණ ගෙවීයාමකට සහ කල්බදු මූල්‍යකරණයේ පාර්ශවකරුවන් විසින් එකඟවන ලද සුළු වශයෙන් වූ වෙනස් කිරීම් කිසිවකට යටත්ව, එය බදු ගැණුම්කරුට භාරදුන් තත්වයෙන්ම සිදු කළ යුතුය. වගන්ති අංක 20 අනුව, බදු ගැණුම්කරුගේ කිසියම් පැහැර හැරීමක දී, සපයන ලද උපකරණයේ සන්තකය ආපසු ලබාගැනීමට සහ කල්බදු මූල්‍යකරණයේ නියම හා කොන්දේසිවලට අනුකූලව බදු ගැණුම්කරු එහි විධිවිධාන අනුව කටයුතු කර ඇත්නම්, බදු දීමනාකරු විසින් දරනු ලැබිය හැකිව තිබුණු තත්වයකට, බදු දීමනාකරු පත් කිරීමට අවශ්‍ය අලාභ අයකර ගැනීමට බදු දීමනාකරුට අයිතිය ඇත.<br>පනතේ ඇතුළත් විධිවිධානවලට අනුව, මූල්‍ය කල්බදු යටතේ නියම කර ඇති පරිදි බදු ගැණුම්කරු විසින් නියමිත මුදල් ගෙවා තිබුණද, නොතිබුණද උපකරණයේ සන්තකය, අයකර ගත් මුදල් සහ අයකර ගත් කිසියම් අලාභයක් වේනම් එයද බදු දීමනාකරුට හිමි වේ. එමෙන්ම මූල්‍ය කල්බදු යටතේ වන සමස්ත වගකීම්වලට බදු ගැණුම්කරු යටත් වේ. එබැවින්, පනතේ කිසියම් සංශෝධනයක් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම සඳහා පනත සමාලෝචනය කිරීම අවශ්‍ය විය හැකිය. | දෙපාර්තමේන්තුව විසින් වර්තමාන වෙළඳපල සංවර්ධනය හා ජාත්‍යන්තර යහපත් පරිචයන්ට අනුකූලව මුදල් ව්‍යාපාර පනත සංශෝධනය කිරීම සඳහා වන යෝජනා කරමින් සිටින අතර ඒ අනුව අනාගතයේදී මූල්‍ය කල්බදු පනතට අවශ්‍ය සංශෝධන ද යෝජනා කෙරේ. | මූල්‍ය කල්බදු පනත සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම. |

| | | | |
|---|---|---|---|
| ඈ. | **ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කරගෙන යන සමාගම්වලට බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය සහ අධීක්ෂණය**<br>ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කරගෙන යන සමාගම්වලට බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය සහ අධීක්ෂණය, 2016 ජුලි 15 දින සිට බලපැවැත්වෙන පරිදි 2016 අංක 06 දරණ ක්ෂුද්‍ර මූල්‍ය පනත යටතේ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. තැන්පතු භාර ගන්නා සහ ප්‍රධාන වශයෙන් අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට මූල්‍ය සේවා සපයන සමාගම් (ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර) මෙම පනත යටතේ බලපත්‍රයක් ලබා ගත යුතුය. ඒ අනුව, මෙම පනත බලපැවැත්වෙන දින සිට 2019 අගෝස්තු 30 දක්වා ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කරගෙන යාම සඳහා සමාගම් තුනක් පමණක් බලපත්‍ර ලබාගෙන තිබුණි. තැන්පතු භාර නොගන්නා නමුත් රට තුළ සිටින අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට මූල්‍ය සේවා සපයන සමාගම් මෙම පනත යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නොවේ. එබැවින් එවැනි සමාගම්, මෙම පනත යටතේ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නියාමනය හා අධීක්ෂණය නොකරනු ලබයි. | ක්ෂුද්‍ර මූල්‍ය හා මුදල් ණය දෙන ව්‍යාපාරවල නියැලී සිටින ආයතනවලට බලපත්‍ර ලබා දීම, නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරී පනත (යෝජිත පනත) නම් වූ පාර්ලිමේන්තු පනතක් මගින් ණය නියාමන අධිකාරියක් පිහිටුවීමට යෝජනා කර ඇත.<br>මේ සම්බන්ධයෙන්, දැනට පවතින ක්ෂුද්‍ර මූල්‍ය පනත අහෝසි කරමින් මුදල් අමාත්‍යාංශය විසින් පරිපාලනය කරනු ලබන “ණය නියාමන අධිකාරිය” පාර්ලිමේන්තු පනතක් මගින් පිහිටුවීම සඳහා මුදල් අමාත්‍යවරයා විසින් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත.<br>තැන්පතු භාර නොගන්නා නමුත් අඩු ආදායම්ලාභීන්ට සහ ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට මූල්‍ය පහසුකම් සපයන සමාගම්, යෝජිත පනතේ නියාමන විෂය පථයට ඇතුළත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. | දැනට පවතින ක්ෂුද්‍ර මූල්‍ය පනතේ විෂය පථයට අයත් නොවන ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |
| ඉ. | **ප්‍රාථමික අලෙවිකරුවකුගේ දෝෂ සහිත පරිචය**<br>එක් ප්‍රාථමික අලෙවිකරුවකු සම්බන්ධයෙන් 2011 සිට 2015 දක්වා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද පරීක්ෂණ තුළින් ඕනෑම ප්‍රාථමික අලෙවිකරුවකු විසින් අනුගමනය කිරීම අනිවාර්ය වන නීති හා රෙගුලාසි / විධානයන් උල්ලංඝනය කිරීම් බොහෝමයක් නිරීක්ෂණය වී තිබේ. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණය කරන ලද ඉහත ප්‍රාථමික අලෙවිකරුගේ ප්‍රධාන උල්ලංඝනය කිරීම් පහත පරිදි වේ.<br>• බොහෝමයක් ප්‍රතිවිකුණුම් (ඉහත ප්‍රාථමික අලෙවිකරු විසින් ලබා දෙන ණය) ඉහත ප්‍රාථමික අලෙවිකරුගේ පරිපාලක සමාගම සමඟ සිදු කිරීම.<br>• ප්‍රතිවිකුණුම් ණය දීමට එරෙහිව ප්‍රමාණවත් සුරැකුම්පත් ලබා ගැනීමට අපොහොසත් වීම.<br>• ඉහළ සෘණාත්මක ඔවර්නයිට් නොගැලපීම් (Negative overnight mismatch) | මෙම ප්‍රාථමික අලෙවිකරුගේ පෙර අධ්‍යක්ෂ මණ්ඩලයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. බැංකුව විසින් ප්‍රාථමික අලෙවිකරුගේ පෙර අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට එරෙහිව නියාමන ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>ප්‍රාථමික අලෙවිකරුවන් නියාමනය හා අධීක්ෂණය කිරීමේදී පහත සඳහන් වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී.<br>• ප්‍රාථමික අලෙවිකරුවන් අධීක්ෂණය බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත.<br>• ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා | ආයෝජකයින්ට සිදුවූ පාඩුව පියවා ගැනීමට ගත හැකි පියවර ගැනීම සහ අනාගතයේදී එවැනි සිදුවීම් වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීම. |

පවත්වාගෙන යන නමුත් අවිනිශ්චිත අරමුදල් සැලැස්මක් නොතිබීම.

- ගනුදෙනුකරුවන් සමඟ අත්සන් කරන ලද ප්‍රධාන ප්‍රතිමිලදීගැනීමේ ගිවිසුම් නොමැති වීම.
- ගනුදෙනුකරුවන්ගෙන් ලබාගත් ප්‍රතිමිලදීගැනීමේ ණය සඳහා ප්‍රමාණවත් සුරැකුම්පත් වෙන්නොකිරීම.

බැංකුව විසින් ඉහත ප්‍රාථමික අලෙවිකරුට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් ගනුදෙනුකරුවන්ගෙන් ලබාගත් ප්‍රතිමිලදීගැනීමේ ණය සඳහා ප්‍රමාණවත් සුරැකුම්පත් වෙන්නොකිරීම වැනි උල්ලංඝනය කිරීම් නැවත නැවතත් සිදු කර තිබුණි.

අවසානයේදී, බැංකුව විසින් ඉහත ප්‍රාථමික අලෙවිකරුගේ කළමනාකාරිත්වය ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත 2016 ජනවාරි 04 වැනි දින පවරන ලදි. ප්‍රතිමිලදීගැනීමේ ණය වෙනුවෙන් ප්‍රමාණවත් පරිදි සුරැකුම්පත් වෙන් නොකිරීමෙන් ලැබිය යුතු පොළියද ඇතුළත්ව 2016 ජනවාරි 04 වන දිනට ගනුදෙනුකරුවන්ට අයකර ගත නොහැකි ආයෝජන වටිනාකම රු. බිලියන 7.2 ක් විය. මුළු අයකර ගත නොහැකි වටිනාකමෙන් රු. බිලියන 2.1 ක්, අභ්‍යන්තර අරමුදල් හසුරුවන බැංකුවේ දෙපාර්තමේන්තු හතරට ආපසු අයකර ගත නොහැකි බව පෙන්නුම් කෙරුණි.

වන නියාමන රාමුව ශක්තිමත් කිරීම සඳහා ප්‍රාථමික අලෙවිකරුවන් අධීක්ෂණයට අදාළ නීති සහ රෙගුලාසි සමාලෝචනය කෙරෙමින් පවතී.

- ආයෝජකයින්ට අයත් රජයේ සුරැකුම්පත් අයථා ලෙස පරිහරණය කිරීම් වැළැක්වීම සඳහා 2019.03.25 දින සිට කෙටි පණිවුඩ / විද්‍යුත් තැපැල් ඇඟවීම් සේවාවක් හඳුන්වා දෙන ලදී.

එ. රජයේ සුරැකුම්පත් ගනුදෙනු වලදී අරමුදල් නිරවුල් කිරීම, නිර්ලේඛන සුරැකුම්පත් පියවීම සහ රජයේ සුරැකුම්පත්වල අයිතිය පිළිබඳ වාර්තා කිරීම සඳහා පහසුකම් සපයනු ලබන ලංකාසෙට්ල් පද්ධතියේ පවතින, විගණනයේදී නිරීක්ෂණය වූ සීමාකම් පහත සඳහන් වේ.

- CSL සුරැකුම්පත් ගිණුමේ පවත්වාගෙන යනු ලබන සුරැකුම්පත් (සම්පූර්ණයෙන් මිලදී ගත් සුරැකුම්පත්) ගනුදෙනුකරුගේ අවසරය නොමැතිව ප්‍රාථමික අලෙවිකරුවෙකුට ඉවත් කරගැනීමේ හැකියාවක් ඇත. (ලංකාසෙකියු පද්ධතිය තුළ කිසිදු සීමාකිරීමක් හඳුන්වා දී නැත).
- CRP සුරැකුම්පත් ගිණුමේ වාර්තා කරනු ලබන සුරැකුම්පත්වල හිමිකරු හඳුනාගැනීමට අපහසු වීම.
- CRP සුරැකුම්පත් ගිණුමේ වාර්තා කරනු ලබන සුරැකුම්පත් මත මහ බැංකුව විසින් ගෙවනු ලබන කූපන් මුදල් සහ කල්පිරෙන මුදල් වල ප්‍රතිලාභියා හඳුනාගැනීමට අපහසු වීම.

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2019.03.25 දින සිට රජයේ සුරැකුම්පත්වල චලනය පිළිබඳ තත්‍ය කාලීන දැනුම්දීමක් හඳුන්වා දී ඇත. එම පහසුකමට අමතරව, ඕනෑම වේලාවක (24x7) ගනුදෙනුකරුවන්ට සිය සුරැකුම්පත් ගිණුමට අදාළ ක්‍රියාකාරකම් නිරීක්ෂණය සඳහා සිය සුරැකුම්පත් ගිණුමට වෙබ් පදනම හරහා ප්‍රවේශය විය හැක. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ලංකා සෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිවන්නන්ට, නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියේ රජයේ සුරැකුම්පත් ගනුදෙනු සඳහා නිරවුල් කිරීමේ වටිනාකම, මිල සහ ඵලදා අනුපාතය ඇතුළත් කරන ලෙස උපදෙස් දෙමින් චක්‍රලේඛයක් නිකුත් කිරීමට කටයුතු කරමින්

ආයෝජකයින්ගේ ආරක්ෂාව සඳහා ඕනෑම ප්‍රාථමික අලෙවිකරුවකු විසින් සිදුකළ හැකි උල්ලංඝනය කිරීම් අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

| | | | |
|---|---|---|---|
| | • ලංකාසෙකියු පද්ධතියෙහි ප්‍රාථමික අලෙවිකරු සහ ඔවුන්ගේ ගනුදෙනුකරු අතර සිදු කරනු ලබන ප්‍රතිමිලදීගැනීමේ / ප්‍රතිවිකුණුම් ගනුදෙනුවලදී අපේක්ෂිත මුදල, ආපසු ගෙවන දිනය සහ ආපසු ගෙවන මිල වැනි අදාළ තොරතුරු වාර්තා නොකිරීම.<br>• ප්‍රතිමිලදීගැනීමේ ගනුදෙනු සඳහා වෙන්කර ඇති සුරැකුම්පත් වෙනුවට වෙනත් සුරැකුම්පතක් ආදේශ කිරීමෙන් තොරව එම සුරැකුම්පත් ඉවත් කිරීමට නොහැකි වන අයුරින් ලංකාසෙකියු පද්ධතියෙහි කිසිදු සීමාකිරීමක් නොමැති වීම. | පවතී. | |
| ඒ. | ලංකාසෙට්ල් පද්ධතියේ මෙහෙයුම් සඳහා බැංකුව විසින් නිකුත් කරන ලද ලංකාසෙට්ල් පද්ධති නීති, අනුවාදය 2.1 (2013) හි වගන්ති අංක 2.2 අනුව ප්‍රාථමික අලෙවිකරුවෙකු අනුගමනය කළ යුතු නීති හා රෙගුලාසි උල්ලංඝනය කරන විටදී එම ප්‍රාථමික අලෙවිකරුට එරෙහිව දඩ මුදල් නියම කළ හැකිය. කෙසේ වෙතත්, බැංකුවට මෙම පද්ධති නීති බලාත්මක කිරීමට නොහැකිවීමෙන් ප්‍රාථමික අලෙවිකරුවන්ට එරෙහිව දඩ මුදල් පනවා නොතිබුණි. | පනතක් හරහා සෘජුවම එවැනි දඩ මුදල් පැනවීමට පැහැදිලි බලයක් නොමැති අවස්ථාවක දී, යටත් නීති (පනත් මත පදනම්ව නිකුත් කරනු ලබන රෙගුලාසි හා විධානයන්) මගින් දඩ මුදල් පැනවීමේ නීත්‍යානුකූලභාවය පිළිබඳව නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව අවධානය යොමු කර ඇත. මේ සම්බන්ධයෙන්, බැංකුව විසින් මෙම කාරණය විසඳීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳව සලකා බලනු ඇත. | මෙම කාරණය විසඳීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |
| උ. | ගනුදෙනුකරුගේ යහපතට එරෙහිව කටයුතු කරන ප්‍රාථමික අලෙවිකරුවන්ට දඩ මුදල් පැනවීමට සුදුසු රාමුවක් සකස් කිරීම සඳහා 2015 සැප්තැම්බර් මාසයේදී මුදල් මණ්ඩලය විසින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙත උපදෙස් ලබා දී තිබුණි. කෙසේ වුවද, 2019 සැප්තැම්බර් මාසය අවසන් වන විටත් එවැනි සුදුසු රාමුවක් සකස් කර නොතිබුණි. | නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් යොමු කර ඇති අවධානයන්ට අනුව, නීතිමය ක්ෂේත්‍රය තුළ වඩාත් ඔරොත්තු දීමේ හැකියාව ඇති කිරීම සඳහා වන දණ්ඩනීති විධිවිධාන නීතිගත කිරීමට අවශ්‍ය පනත් සංශෝධනය කළ යුතුය. මේ සම්බන්ධයෙන්, බැංකුව විසින් මෙම කාරණය විසඳීම සඳහා වර්තමානයේදී ප්‍රවේශයන් කිහිපයක් පිළිබඳව සලකා බලමින් සිටී. | මෙම කාරණය විසඳීම සඳහා සුදුසු රාමුවක් සකස් කිරීම. |
| ඌ | 2017 අංක 12 දරන නව විදේශ විනිමය පනත 2017 නොවැම්බර් 20 දින සිට බලාත්මක විය. 1953 අංක 24 දරන විනිමය පාලන පනත යටතේ ආරම්භ කර ඇති, නව පනත බලාත්මක වන දිනට පෙර දිනය එනම්, 2017 නොවැම්බර් 19 දින වන විට විමර්ශන 223 ක් සිදු කරමින් පැවතුණි. නව පනතේ 30 (2) ආ වගන්තිය ප්‍රකාරව, අවලංගු කරන ලද පනත යටතේ සිදු කරනු ලබන සියළුම විමර්ශන සහ විමසීම් නව | ස්වාභාවික යුක්තියේ මූලධර්ම ක්‍රියාත්මක කිරීම සඳහා පුද්ගලයන්ට සවන් දීමට සාධාරණ අවස්ථාවක් ලබා දිය යුතු බැවින් විමර්ශනයක් අවසන් කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටි සැලකිය යුතු තරම් දීර්ඝ වේ.<br>පනත් කෙටුම්පත පිළිබඳව | නව පනත යටතේ විමර්ශන පවත්වන විට, විමර්ශන අවසන් නොවූ බලයලත් නියෝජිතයින් සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීමට ප්‍රමුඛතාවය ලබා දීම. |

පනත බලාත්මක වන දින සිට මාස හයක් ඇතුළත (2018 මැයි 20 දින හෝ ඊට පෙර) එම පනත යටතේ අවසන් කළ යුතුය. 2018 මැයි 20 දින වන විට ඉහත විමර්ශන 223 න් විමර්ශන 66 ක් පමණක් අවසන් කිරීමට විදේශ විනිමය දෙපාර්තමේන්තුවට හැකි වූ බව නිරීක්ෂණය විය. අනෙකුත් අවසන් නොවූ විමර්ශන 157 ආරම්භ කළ වර්ෂය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| ආරම්භ කළ වර්ෂය | **එකතුව** |
| --- | --- |
| 2008 | 01 |
| 2009 | 03 |
| 2010 | 01 |
| 2011 | 02 |
| 2012 | 06 |
| 2013 | 15 |
| 2014 | 24 |
| 2015 | 30 |
| 2016 | 43 |
| 2017 | 32 |
| Total | 157 |

මෙම විමර්ශන මාස හයක කාලයක් තුළදී අවසන් නොවීමේ ප්‍රතිඵල වශයෙන්,

- අවලංගු කරන ලද පනත උල්ලංඝනය කළ පාර්ශවයන් වැඩිදුර විමර්ශන, විමසීම්, ක්‍රියාමාර්ග සහ දණ්ඩනයන්ගෙන් නිදහස් විය.
- නීතිවිරෝධී ලෙස විදේශ විනිමය රටින් පිටතට යාම වැනි බරපතළ සිද්ධීන් සඳහා ඉඩ හැරීම තුළින් කීර්තිනාමයට හානියක් සිදුවනු ඇත.

අදහස් ඉදිරිපත් කරන අවස්ථාවේ දී, විමර්ශන අවසන් කිරීමට කාලය ප්‍රමාණවත් නොවන බව දැනුවත් කළ අතර කෙටුම්පතේ දක්වා ඇති මාස 6 ක කාල සීමාව දීර්ඝ කරන ලෙස ඉල්ලා සිටියේය. කෙසේ වෙතත්, එම ඉල්ලීමක් වාසිදායක ලෙසින් සලකාබලා නොතිබුණි.

නව පනත බලාත්මක කිරීමෙන් පසු, අවලංගු කරන ලද විනිමය පාලන පනත යටතේ ආරම්භ කර ඇති විමර්ශන කටයුතු ඉදිරියට ගෙන යාමට විදේශ විනිමය දෙපාර්තමේන්තුවට හට හැකි වන පරිදි නව පනත වෙත සුදුසු සංශෝධන සිදු කරන ලෙස මුදල් මණ්ඩලය, බැංකුව භාර අමාත්‍යවරයාට නිර්දේශ කළේය. ඒ අනුව එවැනි සංශෝධන සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. කෙසේවෙතත්, අමාත්‍ය මණ්ඩලය විසින් 2018.05.06 දින වැඩිදුර අධ්‍යයනය සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව රඳවා ගන්නා ලද අතර අවසානයේ අවශ්‍ය සංශෝධන සලකා බලා නොතිබුණි.

ඔ. 1937 අංක 07 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනතේ (සංශෝධිත) 4 වන වගන්තිය ප්‍රකාරව, මෙම ආඥා පනත යටතේ ලබා ගත යුතු එක් එක් ණය (භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම) සම්බන්ධයෙන් මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයකින් බලය ලබා දිය යුතුය. කෙසේ වෙතත්, 2018 සහ 2019 යන වර්ෂ සඳහා එවැනි නියෝගයක් ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි. තවද, ආඥා පනතේ 4 වන වගන්තියට පටහැනිව භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ සත්‍ය ප්‍රතිඵල මත පදනම්ව, 2008 සිට 2017 දක්වා වූ වර්ෂ සඳහා වන නියෝග

ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනතට අනුව භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සඳහා ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය කර ඇති අතර භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ විමර්ශනය කිරීම හා වාර්තා කිරීම සඳහා ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් එය ප්‍රායෝගික නොවන බවත් යල්පැන ඇති බවත් පිළිගෙන තිබේ. එබැවින්,

මෙම ආඥා පනතේ අදාළ විධිවිධානයට අනුකූල වීම හෝ ආඥා පනත සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

| | | | |
|---|---|---|---|
| | අදාළ වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේදී ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර තිබුණි. | ආඥා පනතට අවශ්‍ය සංශෝධන සිදු කරන තෙක් පවත්නා පරිචය දිගටම කරගෙන යනු ඇත. | |
| ඕ. | ආසියානු නිෂ්කාශන සංගමය යනු ආසියාවේ සහ පැසිපික් කලාපයේ සහභාගී වන මහ බැංකු අතර අන්තර් කලාපීය ගනුදෙනු සඳහා ගෙවීම්වල බහුපාර්ශ්වික පදනමක් මත බේරුම් කිරීමේ යාන්ත්‍රණයකි. එක් එක් ආසියානු නිෂ්කාශන සංගමයේ සහභාගිවන්නෙකුගේ ශුද්ධ බේරුම්කරණ තත්ත්වය දෛනික හිඟ ශේෂය මත පදනම්ව ගණනය කරනු ලබන අතර මාස දෙකක කාල සීමාවක් දක්වා රඳවා ගෙන ඊළඟ මාසයේ වැඩ කරන දින හතරක් ඇතුළත බේරුම්කරණය සිදු කරනු ලබයි. සමාලෝචිත වර්ෂය තුළ පොලී අනුපාතය සියයට 1.45 ත් සියයට 2.28 ත් අතර ව්‍යාප්ත විය. (2017 - සියයට 0.63 සහ සියයට 1.28). මෙම යාන්ත්‍රණය යටතේ බේරුම්කරණයට අදාළව බැංකුවේ ගිණුම් වෙත සියලුම බැර කිරීම් ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නියමිත දිනයන් හීදි සිදු කළ යුතු අතර මාස දෙක අවසානයේදී පියවිය යුතු මුදල් බැංකුව විසින් ආයෝජනය කරනු ලැබේ. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළදී බැංකුව විසින් ආසියානු නිෂ්කාශන සංගමය වෙත පොලී වියදම් ලෙස ඇමරිකානු ඩොලර් මිලියන 5.97 ක් (දළ වශයෙන් රු. මිලියන 1,091.4 ක්) ගෙවා ඇත. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ රඳවා ගත් මුදල් උපයෝගී කර ගනිමින් උපයන ලද ආයෝජන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 3.22 ක් (දළ වශයෙන් රු. මිලියන 588.6 ක්) විය.<br>එබැවින්, මෙම යාන්ත්‍රණය යටතේ බැංකුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 2.75 ක (දළ වශයෙන් රු. මිලියන 502.8 ක්) අතිරේක වියදමක් වැය කර තිබුණි. | අදාළ කාල සීමාව තුළ සියලුම ප්‍රධාන ආයෝජකයින්ගේ මුදල්වල පොලී අනුපාත අඩු මට්ටමක පැවතීම සහ මෙම යාන්ත්‍රණය යටතේ බේරුම්කරණ සඳහා වූ පොලී අනුපාත ඉහළ මට්ටමක පැවතීම නිසා, මෙම යාන්ත්‍රණය යටතේ බේරුම්කරණ ශේෂයන් සඳහා අමතර වියදම් දැරීමට සිදුවිය.<br><br>කෙසේ වෙතත්, මෙම ශේෂයන් පියවන තෙක් රටේ සංචිතයේ කොටසක් වන අතර, එම නිසා, අදාළ කාල සීමාව තුළ වැඩි සංචිත ප්‍රමාණයක් තිබීම නිසා රටට ප්‍රතිලාභ ලැබුණි. | මෙම යාන්ත්‍රණය මත අතිරේක පොලී වියදම අඩු කිරීම සඳහා ගත හැකි පියවර ගැනීම. |
| ක. | 2012 ජූනි මස 27 වැනි දින පවත්වන ලද රැස්වීමක දී අමාත්‍ය මණ්ඩලය විසින් කාසි අච්චු ගැසීම සඳහා ජාත්‍යාන්තර මිල ගණන් කැඳවීම හෝ පවත්නා සැපයුම්කරුවන් වෙත ඇණවුම් ඉදිරිපත් කිරීම සම්බන්ධව අවසාන තීරණය ගැනීමට මුදල් මණ්ඩලය වෙත අධිකාරී බලය පවරා තිබුණි. කෙසේ වෙතත්, පවත්නා සැපයුම්කරුවන් වෙත ඇණවුම් ඉදිරිපත් කළ හැකි අවස්ථාවන් බැංකුව විසින් නිශ්චය කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 12/0863/504/073 පිළිබඳ අමාත්‍ය මණ්ඩලයේ තීන්දුවේ වලංගුතාවය, කාසි අච්චු ගැසීමේ ප්‍රසම්පාදනය සඳහා බැංකුවේ අධිකාරී සීමාව පිළිබඳව සහ අනාගත කාසි අච්චු ගැසීමේ ප්‍රසම්පාදනය සඳහා මාර්ගෝපදේශ වැනි කරුණු සම්බන්ධයෙන් මුදල් හා පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ අදහස් | මෙම කාරණය විසඳීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |

| | | | |
|---|---|---|---|
| | | ඉල්ලා ඇත. ඒ අනුව, මුදල් හා පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් සපයනු ලබන ප්‍රතිචාර මත පදනම්ව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | |
| ඔ. | ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශ්‍රී ලංකාව සතුව ඇති කෝටා වත්කම් (Quota assets) වැඩි කරන විට, එයින් සියයට 75 ක් ගෙවනු ලබන්නේ පොරොන්දු පත්‍ර නිකුත් කිරීමෙන් වන අතර එය කෝටා වගකීමක් (Quota liability) ලෙස වාර්තා කරනු ලබයි. කෝටා වගකීම්වලට අදාළ ලිපි ලේඛන බැංකුව විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. | 1999 ට පෙර කෝටා වගකීම් ගොඩනගා ඇති ආකාරය පිළිබඳව මූල්‍ය දෙපාර්තමේන්තුවට දැනට ප්‍රමාණවත් තොරතුරු නොමැත. තවද, මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙනුවෙන් නිකුත් කරන ලද පොරොන්දු පත්‍ර කිහිපයක් ආරක්ෂිත භාරයේ තබා ඇති නමුත් ඒවා කෝටා වත්කම සමඟ ගැලපීම සඳහා ප්‍රමාණවත් තොරතුරු නොමැත.<br><br>මෙම කෝටා වැඩි කිරීම පිළිබඳ අවශ්‍ය තොරතුරු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබා ගැනීමට මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් කටයුතු ආරම්භ කළ අතර එය තවමත් ක්‍රියාත්මක වෙමින් පවතී. | මෙම කාරණය විසඳීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |

**3.2 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

---------------------------------------

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ. | 2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව බැංකුවේ සේවකයින්ගෙන් අයකර ගැනීම වෙනුවට, ස්වකීය අරමුදල් වලින් උපයන විට ගෙවීම් බදු (PAYE) සහ බදු මත බදු ලෙස එකතුව රු. මිලියන 499 ක් සහ රු. මිලියන 361 ක් පිළිවෙළින් සමාලෝචිත වර්ෂය සඳහා සහ පසුගිය වර්ෂය සඳහා බැංකුව විසින් ගෙවා තිබුණි.<br>2015 සිට 2017 දක්වා කාල සීමාව සඳහා බැංකුවේ මූල්‍ය මණ්ඩලය සහ බැංකුවේ ක්‍රියාත්මක වන සියලුම පිළිගත් වෘත්තීය සමිති අතර අත්සන් කරන ලද සාමූහික ගිවිසුමට ඇතුළත් කර ඇති ප්‍රතිපාදනය, (බැංකුවේ සේවකයින්ගේ සේවා නියුක්ති ආදායම මත | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගනිමින්, මූල්‍ය මණ්ඩලය විසින් සිය සේවකයින්ගේ උපයන විට ගෙවීම් බදු වගකීම 2019.04.01 සිට බලපැවැත්වෙන පරිදි ඔවුන්ගේ වැටුප් වලින් අඩු කිරීමට අනුමැතිය ලබා දී ඇත. | මේ හා සමාන අනුකූල නොවීම් අනාගතයේදී සිදුවීම වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |

| | | | |
|---|---|---|---|
| | ආදායම් බදු වගකීම බැංකුව විසින් සපුරාලිය යුතුය) 2018 ජනවාරි 01 සිට 2020 දෙසැම්බර් 31 දක්වා බලපැවැත්වෙන පරිදි 2018 සැප්තැම්බර් 20 දින අත්සන් කරන ලද සාමූහික ගිවිසුමට ඇතුළත් වී නොමැති බව තවදුරටත් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, උපයන විට ගෙවීම් බදු 2019 අප්‍රේල් මාසයේ සිට සේවකයින්ගේ වැටුපෙන් අඩු කරනු ලැබේ. | | |
| ආ. | මුදල් නීති පනතේ 117 වන වගන්තියට අනුව, "බැංකුව ස්වකීය හිමිකමක් සපුරා ගැනීමේදී අත්පත් කර ගන්නා සම්බන්ධතාවයක් හැර වෙළඳාමක හෝ වෙනත් ලෙසකින් වාණිජ, කාර්මික හෝ වෙනත් ව්‍යාපාර කටයුත්තක නියැලිය නොයුතුය". මෙම විධිවිධානයට පටහැනිව, බැංකුවට අයත් ගොඩනැගිලි කිහිපයක් අපේක්ෂිත අරමුණු සඳහා යොදා නොගෙන බාහිර පාර්ශවයන් වෙත කුලියට ලබාදී තිබූ අතර බැංකුව විසින් කුලී ආදායම ලෙස රු. මිලියන 402 ක් සමාලෝචිත වර්ෂය තුළ දී උපයා තිබුණි. | මෙම දේපලවලට අදාළ කල්බදු / කුලී ගිවිසුම් සාධාරණ කාල සීමාවකට යටත්ව අවසන් කිරීමට බැංකුවේ මුදල් මණ්ඩලය තීරණය කර ඇත. | පනතේ එම විධිවිධානයට අනුකූල වීම. |
| ඇ. | වයිට් ඒවේස් ගොඩනැගිල්ල (White Aways) 2014 සැප්තැම්බර් 01 දින රු. මිලියන 100 කට මිළදී ගෙන තිබුණු අතර එය 2016 දෙසැම්බර් 31 දක්වා කාලය තුළදී රු. මිලියන 325.42 ක වියදමින් ප්‍රතිසංස්කරණය කරන ලදි. 2016 දෙසැම්බර් 31 දිනට මෙම ගොඩනැගිල්ල රු. මිලියන 187 කට ප්‍රත්‍යාගණනය කිරීමෙන් රු.මිලියන 232.12 ක ප්‍රත්‍යාගණන අලාභයක් සිදුවී තිබුණි. ඒ අනුව, මාස 28 ක් වැනි කෙටි කාලයක් තුළ ගොඩනැගිල්ලේ වටිනාකම සැලකිය යුතු ලෙස අඩු වී තිබුණි. | රජයේ තක්සේරුකරුගේ සේවය උපයෝගී කර ගනිමින් මෙම ගොඩනැගිල්ලේ තවත් තක්සේරුවක් සිදු කිරීමට බැංකුව අවශ්‍ය පියවර ගනු ඇත. | ගොඩනැගිල්ලේ වටිනාකම පහත වැටීමට හේතු සෙවීමට අවශ්‍ය පියවර ගැනීම. |
| ඈ. | කිලිනොච්චි ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු, රු. මිලියන 167.93 කට ප්‍රාග්ධනිත කරමින් 2016 මැයි 31 දින නිම කරන ලද අතර එය 2016 දෙසැම්බර් 31 දක්වා කාලය තුළදී රු. මිලියන 100.84 ක වියදමින් වැඩිදියුණු කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට කිලිනොච්චි ගොඩනැගිලි සංකීර්ණයේ ප්‍රත්‍යාගණන අගය රු. මිලියන 169.5 ක් වුයෙන් රු. මිලියන 96.87 ක ප්‍රත්‍යාගණන අලාභයක් සිදුවී තිබුණි. එබැවින්, මාස 7 ක් වැනි කෙටි කාලයක් තුළ අලුතින් ඉදිකරන ලද ගොඩනැගිල්ලේ වටිනාකම සැලකිය යුතු ලෙස අඩු වී තිබුණි. | රජයේ තක්සේරුකරුගේ සේවය උපයෝගී කර ගනිමින් මෙම ගොඩනැගිල්ලේ තවත් තක්සේරුවක් සිදු කිරීමට බැංකුව අවශ්‍ය පියවර ගනු ඇත. | ගොඩනැගිල්ලේ වටිනාකම පහත වැටීමට හේතු සෙවීමට අවශ්‍ය පියවර ගැනීම. |

| | | | |
|---|---|---|---|
| ඉ. | ස්වෛරී අධ්‍යයන මධ්‍යස්ථානයේ (Sovereign Study Centre) ඉදිකිරීම් කටයුතු 2016 සැප්තැම්බර් 30 වන දින නිම කරන ලද අතර එය රු. මිලියන 212.2 කට ප්‍රාග්ධනිත කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට ස්වෛරී අධ්‍යයන මධ්‍යස්ථානයේ ප්‍රත්‍යාගණන අගය රු. මිලියන 170 ක් වූයෙන් රු. මිලියන 40.79 ක ප්‍රත්‍යාගණන අලාභයක් සිදුවී තිබුණි. එබැවින් මාස 3 ක් වැනි කෙටි කාලයක් තුළ අලුතින් ඉදිකරන ලද ගොඩනැගිල්ලේ වටිනාකම සැලකිය යුතු ලෙස අඩු වී තිබුණි. | රජයේ තක්සේරුකරුගේ සේවය උපයෝගී කර ගනිමින් මෙම ගොඩනැගිල්ලේ තවත් තක්සේරුවක් සිදු කිරීමට බැංකුව අවශ්‍ය පියවර ගනු ඇත. | ගොඩනැගිල්ලේ වටිනාකම පහත වැටීමට හේතු සෙවීමට අවශ්‍ය පියවර ගැනීම. |

### 3.3 අරමුදල් ඌන උපයෝජනය

-----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| Banca Nazionale Del Lavaro හි නොස්ට්‍රෝ ගිණුමේ පවතින රු. මිලියන 36.8 ක (යුරෝ 175,829) අරමුදලින් වසර 15 කට වැඩි කාලයක් තිස්සේ බැංකුව විසින් කිසිදු ගනුදෙනුවක් සිදු කර නොතිබුණි. | මෙම ගිණුම ඉතාලි රජය විසින් ශ්‍රී ලංකා රජයට ලබා දී ඇති ද්‍රව්‍යය ආධාර සමඟ සම්බන්ධ වන අතර එය කළමනාකරණය කරනු ලබන්නේ ඉතාලි විදේශ කටයුතු අමාත්‍යාංශය විසිනි. මෙම ගිණුමට අදාළ තොරතුරු හෝ කිසිදු ලියවිල්ලක් ඔවුන් සතුව නොමැති බව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දන්වා සිටියේය. ඒ අනුව, මෙම ගිණුම වසා දැමිය නොහැක. | මෙම කාරණය විසඳීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |

### 4. තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම

-----------------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක්ම ක්‍රියාකළ යුතුය. කෙසේවෙතත්, බැංකුවේ විෂය පථයට අනුකූලව තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට බැංකුව විසින් කටයුතු කර නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු ඍජුවම සාක්ෂාත් කර ගැනීම සඳහා නෛතික වරමක් හෝ මෙවලම් බැංකුව සතුව නොමැත.<br>තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකු අරමුදල් භාවිතා කළ නොහැක. වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රජයට සිය වාර්ෂික අයවැයෙන් මුදල් වෙන් කිරීමට අවශ්‍ය වේ.<br>කෙසේ වෙතත්, තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික රාමුවක් සැකසීමේ වැදගත්කම හඳුනාගැනීම සඳහා බැංකුව විසින්, රජයට ලබා දෙන උපදේශන බලය අනුව, 2015 වර්ෂය සඳහා ගරු. මුදල් අමාත්‍යවරයාට ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තාවේ තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ විස්තරාත්මක ලිපියක් ඇතුළත් කරන ලදි. මීට අමතරව, තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳව සහ එවැනි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මුදල් යෙදවීමේ අවශ්‍යතාව පිළිබඳව ප්‍රතිපත්ති සටහන් කිහිපයක් වරින් වර රජයට ඉදිරිපත් කර ඇත. | මෙම න්‍යාය පත්‍රයට බැංකුව අනුකූලද යන්න සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |